**ශීර්ෂය 11 - මුදල් කොමිෂන් සභා කාර්යාලය**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මතය

---------

මුදල් කොමිෂන් සභා කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභා කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභා කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝබර් 05 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මුදල් කොමිෂන් සභා කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභා කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභා කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල

සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- කොමිෂන් සභා කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කලමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම් ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේදී අංක 2002 දරන වැය විෂයය සඳහා සලසා තිබුණු රු.300,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් නොකර එම ප්‍රතිපාදන මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදි වන පරිදි පිළියෙල කල යුතුය. | 2019 වර්ෂය තුළ 2002 වැය විෂය යටතේ විශාල ප්‍රමාණයෙන් යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා සැලසුම් කල පරිදි සිදු නොවූ අතර රජය විසින් වියදම් කළමනාකරණයට උපදෙස් ලබා දී තිබීම නිසා අදාල අයවැය චක්‍රලේඛ අනුව වියදම් පාලනය කර ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 05 ක් සඳහා එකතුව රු.මිලියන 6.8 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා තිබූ අතර උපයෝජනය කළ පසු රු.මිලියන 3.00 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 25 ක සිට සියයට 59 ක් දක්වා වූ පරාසයක විය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදි වන පරිදි පිළියෙල කල යුතුය. | යන්ත්‍ර සූත්‍ර සහ අත්‍යවශ්‍ය නොවන වියදම් කල් දැමීම, නිලධාරීන් ස්ථාන මාරුවීම් ලබා ගැනීම, අලුත්වැඩියා සිදු නොවීම, අතවශ්‍ය පුහුණු වැඩසටහන් සඳහා පමණක් සීමා කිරීම හා වියදම් කළමනාකරණය සඳහා රජයේ උපදෙස් හේතු වී ඇත. ඉදිරියේදී ප්‍රතිපාදන සැලසුම් කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමු කිරීමට සටහන් කර ගන්නා ලදී. |

| | | |
|---|---|---|
| (ඇ) වැය විෂයයන් 13 ක් සම්බන්ධයෙන් මූලික වියදම් ඇස්තමේන්තුවට සාපේක්ෂව සංශෝධිත වියදම් ඇස්තමේන්තුවේ වෙනස සියයට 29 සිට සියයට 100 දක්වා පරාසයක විය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදි වන පරිදි පිලියෙල කල යුතුය. | විශේෂ රාජකාරි අවශ්‍යතා පැවතීම සහ අතිකාල ගෙවීම් වැඩිවීම, 1/3 දීමනාව සඳහා අනුමැතිය නොලැබීම, රියදුරු බටා වැඩිවීම, නව සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම, ලිපිද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය අවශ්‍යතාව සහ වෙනස් වීම, නව ගොඩනැගිල්ල වෙත පැමිණීමත් සමඟ වියදම් වෙනස් වීම, චක්‍රලේඛ මඟින් වියදම් කලමනාකරණය කිරීම සහ ඉතිරි ප්‍රතිපාදන වෙනත් අත්‍යවශ්‍ය වූ වියදම් පියවා ගැනීමට කටයුතු කිරීම හේතු විය. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය තුල 2020 වර්ෂයේදී ගෙවා තිබූ රු.78,627 ක් වූ බැරකම් සටහන් කර නොතිබුණි. | නිවැරදි පරිදි මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළයුතු වේ. | අතපසු වීමකින් බැරකම් ප්‍රකාශයේ සටහන් වී නොමැති බව කාරුණිකව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 වත්කම් කළමනාකරණය**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොමිෂන් සභා කාර්යාලය විසින් අත්පත් කරගෙන හෝ වෙනත් ආයතනවලින් ලැබී තිබූ භාණ්ඩ අදාල බඩු වට්ටෝරු පොත් තුලට ඇතුලත් කිරීමේ කාර්යය නිවැරදිව ඉටු නොකිරීම හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ වර්ග 03 ක භාණ්ඩ ඒකක 11 ක් සම්බන්ධයෙන් අතිරික්තයන් නිරීක්ෂණය වි තිබුණි. භාණ්ඩ අතිරික්තතා හා ඌණතා සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ විගණන වාර්තාවෙන්ද පෙන්වා දී තිබුණි. | අදාල වත්කම් ලැබීම්, මිලදී ගැනීම්, ඉවත් කිරීම් හා පවරාදීම් නිවැරදිව වාර්තා වල සටහන් කල යුතුය. | 2019 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ අතිරික්ත වශයෙන් සඳහන් වන භාණ්ඩ වර්ග 3 ක භාණ්ඩ ඒකක 11 වර්තමානය වනවිට බඩු වට්ටෝරු පොත්වලට ඇතුලත් කර ඇති අතර 2018 වර්ෂයේ පැවති අතිරික්ත හා ඌනතා 2019 වර්ෂයේදී පොත්වලට ගැලපීම් සිදුකර ඇත. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ජ) (6) වගන්තිය අනුව කොමිෂන් සභාව තම ස්වකීය කාර්ය පටිපාටිය තීරණය කල යුතුය යන්න සඳහන්ව ඇතත් 2019 වර්ෂය තුලදීද එවැන්නක් සකස් කර ගැනීමට නොහැකි වී තිබුණි. | කාර්ය පටිපාටිය සකස් කිරීම තුලින් අපේක්ෂිත ඉලක්ක කරා ලඟා විය යුතු වේ. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ජ) (6) අනුව මුදල් කොමිෂන් සභාවේ කාර්යන් ඉටුකිරීමට කාර්ය පටිපාටියක් සකස් කරගත යුතුවේ. 154(ජ) 3 හා 4 (අ) හා (ආ) මගින් දක්වා ඇති කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍යතා ඇගයීම් ක්‍රියාවලියක් වාර්ෂිකව පිළියෙල කරන අතර ඒ අනුව පළාත්වලට අවශ්‍ය මූලධන හා පුනරාවර්තන අවශ්‍යතා ඇගයීම් කර අදාල නිර්දේශ ආණ්ඩුවට හා අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබයි. |
| (ආ) 2018 හා 2019 වර්ෂවල ක්‍රියාකාරී සැලැස්ම තුල මුදල් කොමිෂන් සභා පනතක් සකස් කිරිමේ ක්‍රියාකාරකමක් ඇතුලත්ව තිබූ නමුත් 2019 වර්ෂය අවසන් වන විටත් එහි කටයුතු අවසන් වී නොතිබුණි. | මෙම කටයුතු නිම කිරීමට වගකිවයුත්තන්ගේ අවධානය යොමු විය යුතුය. | 2019 වර්ෂය අවසන් වන විට මුදල් කොමිෂන් සභා පනත සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාකොට නැවත සංශෝධිත කෙටුම්පත පිළියෙල කිරීමට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට තිබුණි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමේදී තිරසර සංවර්ධන ඉලක්ක පදනම් කරගත් සැලසුම්කරන ක්‍රියාවලියක් සිදුව තිබුණ ද, සංවර්ධන සැලසුම් සමාලෝචනයේදී තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ සැලකිලිමත් වී ඒ පිළිබඳව කාර්යසාධන වාර්තාවේ තොරතුරු ඇතුලත් කර පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරිමක් සිදුකර තිබූ බව නිරීක්ෂණය නොවීය. | සංවර්ධන සැලසුම් සමාලෝචනයේදීද තිරසාර සංවර්ධන ඉලක්ක කෙරේ අවධානය යොමුකල යුතු වේ. | කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී සමස්ථ පළාත් සැලසුම්වල ප්‍රගති සමාලෝචනය කිරීමක් සිදු නොකරන බැවින් පළාත් විසින් ලබාගෙන ඇති සංවර්ධන ප්‍රගතිය පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරිම සිදු කරනු නොලබයි. එසේ වුවද අවස්ථානුකූලව දැනුම ලබා ගැනිම සඳහා අහඹු ලෙස තෝරා ගනු ලැබූ සංවර්ධන ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරිම සිදු කරනු ලබයි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභා කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 4 ක් හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු 17 ක් ද සහිතව පුරප්පාඩු 30 ක් පැවති අතර සමාලෝචිත වර්ෂයේ එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ අවශ්‍ය නොවන්නේ නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ අපොහොසත් වී තිබුණි. | අදාල පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කල යුතු වේ. | පුරප්පාඩු සඳහා නිලධාරීන් ලබා දෙන මෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. සංවර්ධන නිලධාරී පුරප්පාඩු සඳහා දැනට පුහුණුවන උපාධිධාරීන් අනුයුක්ත කර ඇති අතර එම අත්‍යාවශ්‍ය තනතුරු රජයේ ප්‍රතිපත්තිය අනුව හැකි ඉක්මනින් පුරවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |